**ශ්‍රී ලංකා මහ බැංකුව - 2023**

**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ("බැංකුව") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තියේ සහ 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 101 වගන්තියේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා ලබා ගන්නා ලදී.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යයසාධනය සහ මුදල් ප්‍රවාහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (IFRSs) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

මා විසින් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISAs) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිතීන් යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3.1 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පාලක මණ්ඩලයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම පාලක මණ්ඩලයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම පාලක මණ්ඩලයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය බැංකුව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා බැංකුව විසින් පවත්වාගෙන යා යුතුය.

### 1.3.2 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ජාත්‍යන්තර විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ජාත්‍යන්තර විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ පාලක මණ්ඩලය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා පාලක මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත බැංකුවේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව බැංකුව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව බැංකුව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව බැංකුව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව, සමාලෝචිත වර්ෂයේ බැංකුවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. බිලියන 114.4 ක ශුද්ධ අලාභයක් වූ අතර, ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේ ශුද්ධ අලාභය රු. බිලියන 374.3 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. බිලියන 259.9 ක වර්ධනයක් පිළිබිඹු විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව විදේශීය මූල්‍ය ආයෝජන ආදායමේ වැඩිවීම, මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ බැංකුවේ ප්‍රධාන ආදායම් විෂයයන් සහ ප්‍රධාන වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර පහත දක්වා ඇත.

| | 2023 | 2022 | විචලනය {හිතකර/(අහිතකර)} | |
|---|---|---|---|---|
| | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | ප්‍රතිශතය % |
| **විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | **86.2** | **(135.7)** | **221.9** | **163.5** |
| පොලී ආදායම | 18.0 | 1.6 | 16.4 | 1,025.0 |
| උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණන ලාභය / (අලාභය) | 29.2 | (127.3) | 156.5 | 122.9 |
| මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වූ ලාභය /(අලාභය) | 39.0 | (10.0) | 49.0 | 490.0 |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත වියදම්** | **142.6** | **33.0** | **(109.6)** | **(332.1)** |
| පොලී වියදම් | 142.5 | 32.3 | (110.2) | (341.2) |
| **ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය/ (පාඩුව)** | **140.1** | **(610.1)** | **750.2** | **123.0** |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත මුළු ශුද්ධ ආදායම** | **(186.4)** | **437.7** | **(624.1)** | **(142.6)** |
| වෙනත් ආදායම් | 1.6 | 2.5 | (0.9) | (36.0) |
| වෙනත් වියදම් | 3.5 | 10.3 | 6.8 | 66.0 |
| මෙහෙයුම් වියදම් | 9.8 | 25.3 | 15.5 | 61.3 |
| **බදු** | **-** | **-** | **-** | **-** |
| **වර්ෂය සඳහා ලාභය (අලාභය)** | **(114.4)** | **(374.3)** | **259.9** | **69.4** |

(ආ) 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ පනතේ 95 වන වගන්තිය ප්‍රකාරව තීරණය කළ පරිදි, සමාලෝචිත වර්ෂයේ බෙදාහැරිය හැකි ඉපැයීම් ඍණ රු.බිලියන 313.74 ක් ක් වූ අතර, ඊට සාපේක්ෂව පසුගිය වර්ෂයේ බෙදාහැරිය හැකි ලාභය රු.බිලියන 235.03 ක් විය. 2023 වසර සඳහා බෙදාහැරිය හැකි ඉපැයීම් නොමැති බැවින්, සංචිත සඳහා මාරු කිරීම හෝ රජය විසින් බැංකුවට ගෙවීමට ඇති රු.බිලියන 7.4 ක ණය ප්‍රමාණය නැවත අයකර ගැනීමට හෝ ඒකාබද්ධ අරමුදල වෙත මාරුකිරීම හෝ සිදුනොකරන ලදි. කෙසේ වෙතත්, රු.බිලියන 235.03 ක් වූ 2022 වර්ෂයේ සමස්ත බෙදාහැරිය හැකි ලාභය, 2023 වර්ෂයේදී අතිරික්ත ගිණුමකට මාරුකර තිබුණි.

## 2.3 බැංකුවේ ශේෂපත්‍ර අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) බැංකුවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, බැංකුව සතුව ඇති භාණ්ඩාගාර බිල්පත් තොගයේ වටිනාකම 2022 වර්ෂය අවසානයට පැවති රු. බිලියන 2,480 (පොත් අගය) සිට 2023 වර්ෂය අවසාන වන විට රු.බිලියන 208 (පොත් අගය) දක්වා අඩුවිය. කෙසේ වෙතත්, බැංකුව සතුව ඇති භාණ්ඩාගාර බැඳුම්කර තොගයේ වටිනාකම 2022 වර්ෂය අවසානයට පැවති රු. බිලියන 17.7 (පොත් අගය) සිට 2023 වර්ෂය අවසාන වන විට රු.බිලියන 1,804.2 (පොත් අගය) දක්වා වැඩිවිය. දේශීය ණය ප්‍රශස්තකරණයේ කොටසක් ලෙස රු.බිලියන 344.7 ක් වූ බැංකුව විසින් රජයට දෙන ලද නොපියවූ තාවකාලික අත්තිකාරම් සහ රු.බිලියන 2,368 ක් වූ රජයෙන් මිලදී ගත් භාණ්ඩාගාර බිල්පත්, ක්‍රමයෙන් අඩුවන ස්ථාවර කූපන් පොලියක් ලැබෙන නව භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත් බවට ප්‍රතිව්‍යුහගත කර පරිවර්තනය කිරීම 2023 සැප්තැම්බර් 21 වැනි දින සිදුවිය. දේශීය ණය ප්‍රශස්තකරණය යටතේ, 2024 වර්ෂයේ පෙබරවාරි මස සිට සැප්තැම්බර් මාසය දක්වා වන කාලසීමාවේදී කල්පිරෙන භාණ්ඩාගාර බිල්පත් සහ වසර 6 සිට 15 දක්වා කාලසීමාවකදී කල්පිරීමට නියමිත, 2024 වසර තෙක් සියයට 12.4 ක් ( 2024 ද ඇතුළත්ව), 2026 වසර තෙක් සියයට 7.5 ක් (2026 ද ඇතුළත්ව) හා 2027 සිට කල්පිරෙන දිනය තෙක් සියයට 5 ක් වශයෙන් ක්‍රමයෙන් අඩුවන ස්ථාවර කූපන් පොලියක් ලැබෙන භාණ්ඩාගාර බැඳුම්කර ලැබී තිබුණි. නව උපකරණවල සාධාරණ අගය සහ ගනුදෙනු අගය අතර වෙනස හේතුවෙන් ඉහත ප්‍රතිව්‍යුහගතකරණයේදී රු.බිලියන 766.4 ක 'එක්දින පාඩුවක් (Day one loss)' නිර්මාණය විය.

(ආ) බැංකුවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, බැංකුවේ විදේශ වත්කම්වල වටිනාකම 2022 වර්ෂය අවසානයට පැවති රු. බිලියන 991.4 සිට 2023 වර්ෂය අවසාන වන විට රු.බිලියන 1,703.6 දක්වා රු.බිලියන 712.2 කින් හෙවත් සියයට 71.8 කින් වැඩිවී තිබුණි. බැංකුව විසින් ප්‍රසිද්ධ කරනු ලබන සතිපතා ආර්ථික දර්ශක අනුව, 2021 අගෝස්තු මාසයේදී බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් රු.බිලියන 83.9 ක සෘණ ශේෂයක් වාර්තා කිරීම ආරම්භ කර තිබුණි. 2022 දෙසැම්බර් අවසාන වන විට මෙම සෘණ ශේෂය රු.බිලියන 1,613.9 දක්වා වැඩිවී තිබුණි. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් හා 2024 අප්‍රේල් අවසාන වන විට සෘණ ශුද්ධ විදේශ වත්කම් ශේෂය පිළිවෙලින් රු.බිලියන 837.3 දක්වා හා රු.බිලියන 315.3 දක්වා අඩු වී තිබුණි.

(ඇ) මුදල් නීති පනතේ (2023 සැප්තැම්බර් 14 දක්වා ක්‍රියාත්මක වන) 39(බී) වගන්තිය අනුව, ව්‍යවස්ථාපිත, හිමිකම්වලට සාපේක්ෂව දේශීය වත්කම් අනුපාතය සියයට 15 ක් විය යුතුය. 2023 අගෝස්තු අවසානයේදී මෙම අනුපාතය සියයට 22.7 ක් විය. තවද, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 96(1)(ආ) වගන්තිය අනුව, ගෙවා නිමි ප්‍රාග්ධනය සහ පොදු සංචිත බැංකුවේ මුළු මුදල්මය බැරකම්වලින් සියයට හයක්වත් විය යුතුය. 2023 දෙසැම්බර් 31 දිනට හා 2024 ජූනි අවසානයට මෙම අනුපාතය පිළිවෙලින් සියයට 6.1 ක් හා සියයට 22.3 ක් විය.

## 3. මෙහෙයුම් කටයුතු සම්බන්ධ නිරීක්ෂණ

### 3.1 බැංකුව විසින් මෙහෙයවනු ලබන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ සාමාජික ආයතන විසින් වාරික ගෙවීම පැහැර හැරීම මත දඩ මුදල් ගෙවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 නොවැම්බර් 15 දිනැති 2023 අංක 01 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත් නියෝගයේ 7(iii) වගන්තිය ප්‍රකාරව, කිසියම් සාමාජික ආයතනයක් ගෙවිය යුතු වාරික ගෙවීමේදී යම් පැහැර හැරීමක් සිදුකරන විට, එම සාමාජික ආයතනය එම පැහැර හැරීමේ කාලසීමාව සඳහා දඩයක් බැංකුවට ගෙවීමට බැඳී සිටියි. කෙසේ | දඩ මුදල් අයකරගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ අරමුදලට ඇතිවිය හැකි අලාභ සැලකිල්ලට ගනිමින්, 2023 අංක 17 දරන බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ නව විධානයක් නිකුත් කිරීම මගින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ | සාමාජික ආයතන විසින් දඩමුදල් ගෙවීම සඳහා නිශ්චිත කාලයක් ඇතුළත් කිරීම අවශ්‍ය වේ. |

| | |
|---|---|
| වෙතත්, දඩ මුදල ගෙවිය යුතු නිශ්චිත කාලපරිච්ඡේදයක් එම විධානය තුළ නියමකර නොතිබුණි. | යෝජනාක්‍රමයේ සාමාජික ආයතන විසින් දඩමුදල් ගෙවීම සඳහා නිශ්චිත කාලයක් ඇතුළත් කිරීමට එකඟ වේ. |

### 3.2 ව්‍යාපාර කටයුතු අත්හිටවූ ප්‍රාථමික අළෙවිකරුවන් සම්බන්ධයෙන් වන විමර්ශනවල තත්වය සහ වැඩිදුර ක්‍රියාමාර්ග

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 ජූලි 06 දිනැතිව බැංකුව විසින් නිකුත් කළ පුවත්පත් නිවේදනය අනුව, ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත හා දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ නිකුත් කරන ලද නියෝගයන්ට අනුව කටයුතු කරමින්, 2017 ජූලි මස 06 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිශ්චිත ප්‍රාථමික අළෙවිකරුවකු විසින් කරනු ලබන ව්‍යාපාර කටයුතු සහ ක්‍රියාකාරකම් 2017 ජූලි මස 06 වැනි දින ප.ව.4.30 සිට බලපැවැත්වෙන පරිදි මාස හයක කාලසීමාවක් සඳහා අත්හිටුවීමට තීරණය කර තිබුණි. බැංකුව විසින් කරනු ලබන විමර්ශන කටයුතු තවදුරටත් කරගෙන යාම පිණිස අත්හිටුවීම 15 වතාවක් අඛණ්ඩව දීර්ග කිරීමට මුදල් මණ්ඩලය/පාලක මණ්ඩලය අනුමත කර තිබුණි. අවසාන දීර්ග කිරීම 2024 ජූලි 05 දින සිට ක්‍රියාත්මක වන පරිදි තවත් මාස 6 ක් බලපැවැත්වේ. ඔවුන් වෙත නිකුත් කරන ලද 2017 දෙසැම්බර් 27 දිනැති ලිපියෙන් අවශ්‍ය පරිදි හේතු දැක්වීමට ප්‍රාථමික අළෙවිකරු අපොහොසත්වීම හා ප්‍රාථමික අළෙවිකරුගේ ප්‍රධාන විධායක නිලධාරී විමර්ශන සඳහා ඉදිරිපත් නොවීම නිසා, 2017 දෙසැම්බර් සිට ප්‍රාථමික අළෙවිකරුගේ විමර්ශන අවසන් කිරීමට බැංකුවට නොහැකි වූ බව සඳහන් විය. ඒ අනුව, වසර හයකට වඩා වැඩි කාලයක් විමර්ශන ප්‍රමාද වී තිබුණි. | ප්‍රාථමික අළෙවිකරුගේ ප්‍රධාන විධායක නිලධාරියා සාක්ෂි කරුවකු ලෙස සැලකීම විචක්ෂණශීලී බවත්, මෙම අවස්ථාවේදී නියාමන විමර්ශනයක සාක්ෂි දීමට ඔහුට බලකළ නොහැකි බවත්, 2019.12.16 දිනැති ලිපියක් මඟින් නීතිපති දෙපාර්තමේන්තුව උපදෙස් දී ඇත. මීට අමතරව, විමර්ශනය අවසන් කිරීමට පෙර ප්‍රාථමික අළෙවිකරුගේ ප්‍රධාන විධායක නිලධාරියාගේ සාක්ෂි ලබාගැනීම විචක්ෂණශීලී බව එම ලිපියෙන් නීතිපති දෙපාර්තමේන්තුව උපදෙස් දී ඇත.<br>එබැවින්, ඉහත සඳහන් කරුණුවලට අනුව, මහාධිකරණ නඩුව අවසන්වීම මත, ප්‍රාථමික අළෙවිකරුගේ ප්‍රධාන විධායක නිලධාරියා සක්ෂි දීමට ඉදිරිපත්වන තුරු විමර්ශනය අවසන් කළ නොහැකි වේ. | විමර්ශන අවසන් කිරීමට හැකි මාර්ග සෙවීම අවශ්‍ය වේ. |

### 3.3 සේවා අංශයේ අපනයන ඉපයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් නීති පනත/ 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතෙහි විධිවිධාන ප්‍රකාරව, බැංකුව විසින් නිකුත් කළ රීතිවලට අනුව, සෑම භාණ්ඩ සහ/ හෝ සේවා අපනයනකරුවෙකුම, අපනයනය කරන ලද සියලු භාණ්ඩ සහ/ හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට සපයන ලද සේවාවලට අදාළව අපනයන ඉපයීම්, අදාල පරිදි භාණ්ඩ නැව්ගත | "ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකිරීමේ පද්ධතිය" නමින් පද්ධතියක් බැංකුව | සේවා අපනයන ඉපයීම් ගෙන්වාගැනීම සම්පූර්ණ වශයෙන්ම අධීක්ෂණය කිරීමට යාන්ත්‍රණයක් |

| | | |
|---|---|---|
| කරන කරන ලද දිනයේ සිට හෝ සේවාවන් සැපයූ දිනයේ සිට දින 180 ක් ඇතුළත අනිවාර්යෙන්ම ශ්‍රී ලංකාව වෙත ගෙන්විය යුතුය. අපනයන ඉපයීම් ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැනීම් කාර්යක්ෂමව අධීක්ෂණය කිරීමේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින්, අපනයන ඉපයීම් අධීක්ෂණ පද්ධතිය බැංකුව විසින් 2022 ජූනි මස හඳුන්වා දුන් අතර, එම පද්ධතිය මඟින් අපනයන ඉපයීම් නියමිත කාලසීමාව තුළ ගෙන්වා ගැනීම් සහ අපනයන ඉපයීම් දේශීය ව්‍යවහාර මුදල්වලට පරිවර්තනය කිරීම අධීක්ෂණය කිරීමට පහසුකම් සපයයි. බැංකුව, ශ්‍රී ලංකා රේගුව සහ බලයලත් වෙළඳුන් මෙම පද්ධතියේ ප්‍රධාන සහභාගිකරුවන් තිදෙනා වේ. සේවා අපනයනයන් ශ්‍රී ලංකා රේගුව හරහා සිදු නොවන බැවින් එම අපනයන ඉපයීම් බලයලත් වෙළඳුන් විසින් සපයනු ලබන තොරතුරු සමඟ සැසඳිය නොහැකි වේ. එබැවින්, ඉහත පද්ධතිය මඟින් සේවා අපනයන ඉපයීම් ගෙන්වා ගැනීම, සම්පූර්ණ වශයෙන්ම අධීක්ෂණය නොවන බව නිරීක්ෂණය විය. | සංවර්ධනය කර ඇති අතර, එය සේවා අපනයනවලට අදාලව විදේශ විනිමය ගලාඒම් සම්බන්ධව සියලු අදාල සංඛ්‍යා ලේඛන ලබාගැනීමට භාවිතා කරනු ලබයි. | හඳුන්වාදීම අවශ්‍ය වේ. |

### 3.4 බැංකුවේ නොට්ටු ඇසුරුමක (බණ්ඩලයක) අඩුවීමක් වාර්තාවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 අප්‍රේල් 23 දින බැංකුව විසින් නිකුත් කළ මාධ්‍ය නිවේදනය අනුව, 2023 අප්‍රේල් 11 දින ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු අතරතුරේදී, මහබැංකුවේ අභ්‍යන්තරයේ වූ සුරක්ෂිතාගාරයක් තුළ රු.මිලියන 5 ක් (රුපියල් 5,000 නෝට්ටු) වටිනාකමක් සහිත නෝට්ටු ඇසුරුමක (බණ්ඩලයක) අඩුවීමක් අනාවරණය වී තිබුණි. මේ සම්බන්ධව අභ්‍යන්තර විමර්ශනයක් වහා අරඹන ලද අතර, කොටුව පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, 2024 සැප්තැම්බර් 15 දින වන විටත්, මෙම නොට්ටු ඇසුරුමක (බණ්ඩලයක) අඩුවීම සඳහා වගකිව යුතු කිසිදු පාර්ශවයක් හඳුනාගෙන නොතිබුණි. | විමර්ශන සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම, බැංකුවේ අධිපතිවරයා ඉල්ලා සිටි අතර, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශනවල විස්තරාත්මක සොයාගැනීම් හා ක්‍රියාමාර්ග අපේක්ෂාවෙන් සිටියි.<br>අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශනවලට අමතරව, අඩුවීමට තුඩු දුන් තත්වයන් හා අභ්‍යන්තර ක්‍රියාවලීන් පරීක්ෂා කිරීමට, ක්‍රියාපටිපාටි දෝෂ හෝ මෙහෙයුම් දුර්වලතා හඳුනාගැනීමට, අනාගත සිදුවීම් වළක්වාගැනීමට ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම සඳහා අභ්‍යන්තර කරුණු සෙවීමේ කමිටුවක් බැංකුව විසින් පත්කරන ලදි. කමිටුවේ වාර්තාව එක් මාසයක් ඇතුළත නිකුත් කරනු ලැබේ. | අනාගතයේදී මෙවැනි සිදුවීමක් වළක්වා ගැනීම සඳහා අමතර ආරක්ෂක ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. |

### 3.5 බැංකුව විසින් උද්ධමන ඉලක්ක ළඟාකර ගැනීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 26(1) වගන්තිය ප්‍රකාරව, බැංකුව විසින් ළඟාකර ගත යුතු උද්ධමන ඉලක්කය | ළඟා කර ගත්, කොළඹ පාරිභෝගික | අනාගතයේදීත් සමාන තත්වයක් පවත්වා |

| | | |
|---|---|---|
| දැක්වෙන මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමක් අමාත්‍යවරයා සහ බැංකුව විසින් අත්සන් කළ යුතුය. අමාත්‍යවරයා සහ බැංකුවේ අධිපතිවරයා 2023 ඔක්තෝබර් 03 දින (2023.10.05 දිනැති අංක 2352/20 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ ප්‍රකාශ කළ පරිදි) මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමට එළඹුණු අතර ඒ අනුව, එකඟ වූ මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම යටතේ, බැංකුව කාර්තුමය මතුපිට උද්ධමන අනුපාතිකය සියයට 5 ක මට්ටමේ පවත්වා ගැනීමට ඉලක්ක කර ගත යුතුය. තවද, පනතේ 26(5) වගන්තියේ අවශ්‍යතාවය සඳහා උද්ධමන ඉලක්කය සඳහා වන ආන්තිකය ප්‍රතිශතාංක +(-) 2 ක් වේ. ඒ අනුව, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත අදාල කාර්තුවේ මාස තුන සඳහා වන මාසික කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යාමය ප්‍රතිශත වෙනසෙහි සරල සාමාන්‍ය 2023 වර්ෂයේ අවසාන කාර්තුව සඳහා සහ 2024 වර්ෂයේ පළමු කාර්තු දෙක සඳහා පිළිවෙලින් සියයට 2.97 ක්, සියයට 4.4 ක් හා සියයට 1.37 ක් විය. එබැවින්, 2023 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා සහ 2024 අප්‍රේල් සිට ජූනි දක්වා කාලය තුළ සත්‍ය උද්ධමනය, ඉලක්කගත උද්ධමනයට වඩා අඩු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, අනුක්‍රමික කාර්තු දෙකකදී කාර්තුමය උද්ධමන අනුපාතිකය සියයට 5 වඩා සියයට 2 කින් අඩු/වැඩි නොවී ඇති නිසාවෙන් උද්ධමන ඉලක්ක උල්ලංඝණය කිරීමක් සිදුවී නොතිබුණි. | මිල දර්ශකය මත පදනම්වන කාර්තුමය මතුපිට උද්ධමනය, අනුක්‍රමික කාර්තු දෙකකදී ඉලක්කගත සියයට 5 වඩා සියයට 2 කින් අඩු/වැඩි වන්නේ නම් උද්ධමන ඉලක්ක උල්ලංඝණය කිරීමක් ඇති වේ. උද්ධමන ඉලක්ක උල්ලංඝණය කිරීමක් තවම වාර්තා වී නොමැත. | ගැනීමට යෝජනා කරනු ලැබේ. |

**3.6 අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යන හෝ තැන්පතු භාර ගන්නා තැනැත්තන්ට එරෙහි ක්‍රියාමාර්ගවල ප්‍රගතිය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 42 වන වගන්තිය ප්‍රකාරව, මුදල් ව්‍යාපාර පනතේ 2 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් තැනැත්තකු මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලැබුවේ ද හෝ කරගෙන යන්නේද හෝ තැන්පතු භාරගනු ලැබ තිබේද හෝ භාර ගන්නේ ද යනු නිසැකව දැනගැනීමේ කාර්යය සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා හෝ අධ්‍යක්ෂවරයා විසින් ඒ සඳහා බලය දෙන ලද බැංකුවේ යම් නිලධරයකු විසින් හෝ විමර්ශනයක් පවත්වනු ලැබිය හැකි අතර, ඒ කාර්යය සඳහා මුදල් ව්‍යාපාර පනතේ දැක්වෙන ක්‍රියාමාර්ග ගනු ලැබිය හැකිය. ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, 2022 හා 2023 වර්ෂතුළදී හා 2024 ජූලි 31 දක්වා කාලය තුළ ලැබුණු පැමිණිලි මත සිදුකරන විමර්ශනවල ප්‍රගතිය පහත පරිදි වේ. | විමර්ශන පැවැත්වීමේදී, චූදිත පාර්ශවයන් සාමාන්‍යයෙන් ඔවුන්ගේ ගනුදෙනුකරුවන් මෙන්ම නියාමන හා නීතිය ක්‍රියාත්මක කරන ආයතන මග හැරීමට උත්සාහ කරන බැවින්, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, විමර්ශනවලට විෂයවන පාර්ශවයන්ගෙන් අවශ්‍ය තොරතුරු ලබාගැනීමේ සැලකිය යුතු ප්‍රමාදයක් අත්විඳිනු ලබයි. මෙම පාර්ශවයන් සිටින ස්ථාන | විමර්ශන අවසන් කිරීමට යාන්ත්‍රණයක් සොයාගැනීම අවශ්‍ය වේ. |

| | 2022 | 2023 | 2024 (2024.07.31 දක්වා) |
|---|---|---|---|
| ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව | 71 | 128 | 93 |
| අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාර කටයුතු කිරීම / තැන්පතු භාරගැනීම සම්බන්ධ පැමිණිලි සංඛ්‍යාව | 24 | 19 | 11 |
| ආරම්භ කළ විමර්ශන සංඛ්‍යාව | 24 | 19 | 11 |
| *අවසන් කළ විමර්ශන සංඛ්‍යාව (මේ තුළ 2019 සිට ආරම්භ කළ විමර්ශන ඇතුළත් වේ.) | 8 | 12 | 4 |
| 2024.07.31 දිනට කරමින් පවතින මුළු විමර්ශන සංඛ්‍යාව | 122 | | |

ඉහත වගුවට අනුව, අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාර කටයුතු කිරීම / තැන්පතු භාරගැනීම සම්බන්ධව සැලකිය යුතු පැමිණිලි සංඛ්‍යාවක් 2022, 2023 හා 2024 (2024 ජූලි 31 දක්වා) වර්ෂ තුළ ලැබී තිබුණු අතර, 2024 ජූලි 31 දිනට විමර්ශන බොහොමයක් කෙරෙමින් පැවතුණි.

මුදල් ව්‍යාපාර පනතේ 59 වන වගන්තියට අනුව, මූල්‍ය කරුණු පිළිබඳව ජනතාවගේ දැනුම වැඩිදියුණු කිරීමේ අරමුදල නම් වූ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුය. මුදල් ව්‍යාපාර පනත යටතේ ලැබෙන සියලු දඩ මුදල් අරමුදලට බැරකරනු ලැබිය යුතු අතර අරමුදලේ බැරට ඇති මුදල් පාලක මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන කාර්ය සඳහා සහ එවැනි ආකාරයකට භාවිතා කරනු ලැබිය යුතුය. ඉහත අරමුදලේ බැරට ඇති මුදල් ශේෂය රු. 2,795,599 ක් වූ අතර, එය 2022, 2023 හා 2024 ජූනි දක්වාත් උපයෝජනය කර නොතිබුණි.

සොයාගැනීම සහ අවශ්‍ය තොරතුරු ලබාගැනීම කාලය ගතවන අතර ප්‍රමාදයන් ඇති කරයි. විමර්ශනයේ ස්වභාවය මත පදනම්ව බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව හට, අනෙකුත් නීතිය ක්‍රියාත්මක කරන ආයතන සමඟ සම්බන්ධ වී සම්බන්ධීකරණය කිරීමට සිදුවන අතර එය සාමාන්‍යයෙන් විමර්ශන ක්‍රියාවලියේ ප්‍රමාදයන් ඇතිකරනු ලැබේ.

මුදල් ව්‍යාපාර පනතේ 59 වන වගන්තිය ප්‍රකාරව, පාලක මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන කාර්ය සඳහා සහ එවැනි ආකාරයකට අරමුදල භාවිතා කරනු ලැබිය යුතුය. ඒ අනුව, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමෙන් පසුව, එය විසින් පවත්වනු ලබන ජනතාවගේ දැනුම වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා අරමුදලේ පවතින මුදල් භාවිතා කරනු ලැබිය හැකිය.